**සංගීත තරග සඳහා අදාළ කොන්දේසි**
**(පොදු උපදෙස් හා කොන්දේසිවලට අමතරව බල පැවැත්වේ.)**

1. එක් කලායතනයක් සඳහා ඒකල තරග 03ක් සහ සමූහ තරග 02ක් වශයෙන් සහභාගීවිය හැකි උපරිම තරග සංඛ්‍යාව 05 කි. ඒකල තරග සඳහා එක් තරගකරුවෙකුට තරග ශීර්ෂ දෙකකට පමණක් ඉදිරිපත් වීමට අවස්ථාව දෙනු ලැබේ. එම තරගකරුවන්ට සමූහ තරගවලට ද ඉදිරිපත් විය හැකිය.

2. එක් එක් තරග ශිර්ෂ සඳහා වයස් සීමාවන් උපදෙස් පත්‍රිකාවෙහි සඳහන් කර ඇති අතර, සහාය වාදකයින් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.
**(සැ.යු. මේ සඳහා කලායතනාධිපතිවරුන්ට සහභාගී විය නොහැක.)**

3. එක් එක් තරගයන් සඳහා ඉදිරිපත්වීමේ දී ලබා දී ඇති කාල සීමාව නොඉක්මවායාමට තරගකරුවන් වගබලා ගතයුතුය. යම් තරග අංශයකට ඉදිරිපත් වීමේ දී ලබා දී ඇති කාලය ඉක්මවා යන්නේ නම්, තරගයෙන් ඉවත් කිරීමේ අයිතිය විනිශ්චය මණ්ඩලය සතුය.

4. සංගීත තරග සඳහා අදාළ කාල සීමාවන් සහ ශිල්පීන් සංඛ්‍යාව නිර්ණායකයන් හි දක්වා ඇත.

5. ශාස්ත්‍රීය ඒකල හා සමූහ ගායන වාදන අංග සඳහා ඉලෙක්ට්‍රොනික් තාම්පුරාව භාවිත කළ හැකි අතර, එය තරගය සඳහා සහභාගී වියහැකි තරගකරුවන් සංඛ්‍යාවට අදාළ කරගනු නොලැබේ.

6. එක් එක් තරග අංශ වලදී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.
    - ශාස්ත්‍රීය බව සහ නිවැරදි ස්වර භාවිතය
    - නිර්මාණාත්මක බව හා භාව ප්‍රකාශනය
    - ශ්‍රැතියට අනුව ගායනය / වාදනය කිරීම
    - උචිත ලය තෝරා ගැනීම හා ලය පවත්වා ගෙන යාම
    - නිර්මාණාත්මක ප්‍රබන්ධ භාවිතයෙහි උචිත බව

**ඉහත නිර්ණායකයන් හැරුණු කොට ඒකල තබ්ලා වාදනාංග ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් පොදු නිර්ණායක පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.**

- ශාස්ත්‍රීය පද භාවිතය
- තබ්ලා වාදනයට අදාළ නිවැරදි අක්ෂර වාදනයෙහි ශක්‍යතාව
- ශාස්ත්‍රීය බව රකිමින් වාදනය ඉදිරිපත් කිරීමේ ශක්‍යතාව
- උචිත ලය තෝරා ගැනීම හා ලය ස්ථාවරව පවත්වා ගෙන යාම
- මාධූර්ය වූ ධ්වනි නිෂ්පත්තිය
- ප්‍රාසාංගික බව

7. එක් එක් තරග ශීර්ෂ සඳහා ඉදිරිපත් වීමේදි සුදුසු ඇඳුම් භාවිත කළ හැකි අතර, **ඒ සඳහා විශේෂයෙන් සකස් කරන ලද වස්ත්‍රාභරණ, වේෂනිරූපනයන් සඳහා ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.**

8. ගායන තරගවල දී ගායනයට හානි නොවන පරිදි අංග චලන යොදා ගත හැක.

9. එක් තරග අංශයක් සඳහා ඉදිරිපත් වන අයදුම්පත්‍ර ප්‍රමාණය සීමිත වන්නේ නම්, අදාළ තරග අංශය පැවැත්වීම තීරණය කිරීමේ බලය අමාත්‍යාංශ ලේකම්වරයා සතුවේ.
උදාහරණ : **ශාස්ත්‍රීය ඒකල වාදන (තබ්ලා) පිරිමි, ගැහැණු වෙන්වෙන් වශයෙන් තරගය පැවැත්වීමට යෝජිතව පවතින අතර, ලැබෙන අයදුම්පත්‍ර ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වුවහොත් එකී තරග අංශ දෙක එක් තරග අංශයක් ලෙස පවත්වනු ලබයි.**

## <u>තරග ශීර්ෂ</u>

**01. ශාස්ත්‍රීය ගායන රාගධාරී - පිරිමි ඒකල - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත රාගය - ජෞන්පූරි**

**02. ශාස්ත්‍රීය ගායන රාගධාරී - ගැහැණු ඒකල - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත රාගය - බාගේශ්‍රී**

**තරග අංක 01 හා 02 ශීර්ෂ සඳහා**

i. මෙම රාගයට අයත් හින්දි බසින් රචිත විලම්බලය ඛ්‍යාල් ගීතයක් සහ මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් ගායනයට ඇතුලත් විය යුතුය.
ii. ශාස්ත්‍රීය ගායන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.
iii. වෙනත් ගායන ශෛලීන්වලට අයත් අංග මිශ්‍ර කළ නොහැක.
iv. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
v. සහභාගී විය හැකි සංඛ්‍යාව - තරගකරු හැර සහය වාදකයින් උපරිම සංඛ්‍යාව 04 කි.

**03. ශාස්ත්‍රීය වාදන රාගධාරී - පිරිමි ඒකල - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත රාගය - මාල්කෞන්ස්**

**04. ශාස්ත්‍රීය වාදන රාගධාරී - ගැහැණු ඒකල - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත රාගය - භීම්පලාසී**

**තරග අංක 03 හා 04 ශීර්ෂ සඳහා**

i. විලම්බලය, මධ්‍යලය හා ද්‍රැතලය වාදිත ඇතුලත් කර ගත හැකිය. විලම්බලය වාදනයක් අනිවාර්ය වේ.
ii. ශාස්ත්‍රීය ඒකල වාදන ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතුය.
iii. නිවැරදි ඉරියව් සහ හස්ත සාධනය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.
iv. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
v. සහය වාදනය සඳහා ඉදිරිපත් විය හැක්කේ උපරිම සංඛ්‍යාව 04 කි.
vi. නිර්දේශිත භාණ්ඩ (වයලින්, සිතාර්, බටනලා, එස්රාජ්, දිල්රුබා, සරෝද්, සාරංගී, බොක්ස් ගිටාර්, මැන්ඩලින්, මෝහන්වීණා, සන්තූර්)

**05. ශාස්ත්‍රීය වාදන - තබ්ලා - ඒකල පිරිමි - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත තාලය - ත්‍රිතාල්**

**06.ශාස්ත්‍රීය වාදන - තබ්ලා - ඒකල - ගැහැණු - වයස් සීමාව - අවු : 15-21**
**නිර්දේශිත තාලය - ත්‍රිතාල්**

**තරග අංක 05 හා 06 ශීර්ෂ සඳහා**

i. ශාස්ත්‍රීය ප්‍රබන්ධ ඇතුළත් වාදනයක් විය යුතුය.
ii. සහාය වාදනය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව උපරිම 02 කි.
iii. කාලය අවම විනාඩි 06 කි. උපරිම විනාඩි 08 කි.
iv. ලෙහෙරා වාදනයත් සමඟ ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

## 07. ශාස්ත්‍රීය ගායන - රාගධාරී - සමූහ - වයස් සීමාව - අවු : 12-21
## නිර්දේශිත රාගය - බහාර්

i. හින්දි බසින් රචිත මධ්‍යලය ඛ්‍යාල් ගීතයක් විය යුතුය.
ii. ඛ්‍යාල් ගායනයට අයත් ශාස්ත්‍රීය ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතුය.
iii. වෙනත් ගායන ශෛලීන්වලට අයත් අංග මිශ්‍ර නොකළ යුතුය.
iv. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 08 කි.
v. ගායනය හා වාදනය සඳහා සහභාගී විය හැකි සංඛ්‍යාව අවම 06 කි. උපරිම සංඛ්‍යාව 15 කි.
vi. වාදක මණ්ඩලය සඳහා සහභාගීවිය හැකි සංඛ්‍යාව උපරිම 05 කි.

## 08. ශාස්ත්‍රීය වාදනය - රාගධාරී - සමූහ - වයස් සීමාව - අවු : 12-21
## නිර්දේශිත රාගය - ජෝග්

i. මධ්‍යලය සහ දෘතලය වාදිත ඇතුලත් කර ගත යුතුය.
ii. ශාස්ත්‍රීය වාදන ආකෘතියට අනුකූල විය යුතුය.
iii. සමූහ වාදන අංග යොදා ගැනීමෙන් විචිත්‍රවත් කර ගත හැකිය.
iv. නිවැරදි ඉරියව් සහ ශිල්පීය ක්‍රම අනුගමනය කළ යුතුය.
v. සහභාගී විය හැකි සංඛ්‍යාව වාදක මණ්ඩලය හසුරුවන්නා ඇතුළුව අවමය 12 කි. උපරිමය 15 කි.
vi. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 8 කි.
vii. භාවිත කළ හැකි වාද්‍ය භාණ්ඩ( වයලීන්, සීතාර්, එස්රාජ්, බටනලා, දිල්රුබා, සරෝද්, සාරංගි, බොක්ස් ගිටාර්, මෝහන්වීණා, සන්තූර්, මැන්ඩලීන්, තබ්ලා, පඛාවාජ්, තාම්පුරා, ස්වර මණ්ඩල, හා(ර්)මෝනියම්)

## 09. නව නිර්මාණාත්මක වාදනය- සමූහ - වයස් සීමාව අවු : 12-21

i. කිසියම් රාගයක් ආශ්‍රිතව සිදුකරන ලද නව නිර්මාණයක් විය යුතුයි.
ii. සහභාගී විය හැකි සංඛ්‍යාව වාදක මණ්ඩලය හසුරුවන්නා ඇතුළුව අවමය 12 කි. උපරිමය 15 කි.
iii. කාලය අවම විනාඩි 06 කි. උපරිමය විනාඩි 8 කි.
iv. භාවිත කළ හැකි භාණ්ඩ ( වයලීන්, සීතාර්, එස්රාජ්, බටනලා, දිල්රුබා, සරෝද්, සාරංගි, බොක්ස් ගිටාර්, මෝහන්වීණා, සන්තූර්, මැන්ඩලීන්, තබ්ලා, පඛාවාජ්, තාම්පුරා, ස්වර මණ්ඩල, හා(ර්)මෝනියම් සහ ආදේශක භාණ්ඩ යොදාගත හැකිය.)

## 10. ජන ගායන පිරිමි - ඒකල - වයස් සීමාව - අවු : 15-21

i. වැලපුම් ගී සහ ශාන්ති කර්ම යන ගායනා ද්විත්වයම ඔබගේ ගායනයට ඇතුළත් විය යුතුය.
ii. දේශීය අවනද්ධ භාණ්ඩ සහ ඝන වාද්‍ය භාණ්ඩ පමණක් සහය වාදනය සඳහා යොදා ගත හැකිය.
iii. කාලය අවම විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.
iv. අවශ්‍යතාවය මත ශ්‍රැතියේ පිහිටීම සඳහා ශ්‍රැති වාද්‍ය භාණ්ඩයක් යොදා ගත හැකිය.

## 11. ජන ගායන ගැහැණු - ඒකල - වයස් සීමාව - අවු : 15-21

i. නෙළුම් ඕසේ සහ ශාන්ති කර්ම යන ගායනා ද්විත්වයම ඔබගේ ගායනයට ඇතුළත් විය යුතුය.
ii. දේශීය අවනද්ධ භාණ්ඩ සහ ඝන වාද්‍ය භාණ්ඩ පමණක් සහය වාදනය සඳහා යොදා ගත හැකිය.
iii. කාලය අවම විනාඩි 03 කි. උපරිමය විනාඩි 05 කි.
iv. අවශ්‍යතාවය මත ශ්‍රැතියේ පිහිටීම සඳහා ශ්‍රැති වාද්‍ය භාණ්ඩයක් යොදා ගත හැකිය.

## 12. ජන ගායන සමූහ - වයස් සීමාව - අවු : 12-21

i. ගොයම් කවි, ශාන්තිකර්ම කවි, තුණ්සරණේ කවි අතුරින් අවම වශයෙන් ගායනා දෙකක් හෝ භාවිතා කළ යුතුය.
ii. විද්‍යුත් නොවන ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැකිය.
iii. ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 10 ක් වන අතර, වාදක මණ්ඩලයත් සමඟ සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 15 කට නොවැඩි විය යුතුය.
iv. කාලය අවම විනාඩි 05 ක් වන අතර, උපරිමය විනාඩි 07 කි.

## 13. සමූහ ගායනය (ස්වතන්ත්‍ර නිර්මාණ) - වයස් සීමාව - අවු: 12න් පහළ

i. **"විරාමයක් ගෙනල්ලා - නිවාඩුවක් ඇවිල්ලා"** (පාසල් නිවාඩුව) යන තේමාව යටතේ ළමා මනසට උචිත ස්වතන්ත්‍ර නිර්මාණයක් ඉදිරිපත් කළ යුතුය.
ii. ගායනය සඳහා සහභාගී විය හැකි අවම සංඛ්‍යාව 8 ක් වන අතර, වාදක කණ්ඩායම සමඟ උපරිම සංඛ්‍යාව 15 කි.
iii. මේ සඳහා ඕනෑම වාද්‍ය භාණ්ඩයක් භාවිත කළ හැකිය.
iv. විදුලි ඕගනය භාවිත කරන්නේ නම්, පෙර සකස් කරන ලද සංගීත ඛණ්ඩ භාවිත කළ නොහැකි අතර, සියළු වාදන ඛණ්ඩයන් සජීවීව වාදනය කළ යුතුය.
v. කාලය අවම විනාඩි 03 ක් වන අතර උපරිමය විනාඩි 05 කි.

**සැ.යු.**

- **තරගයට ඉදිරිපත් වීමට ප්‍රථම, නව නිර්මාණය සඳහා පාදක කරගත් පදරචනය සහ තනු නිර්මාණයට අදාළ ස්වර ප්‍රස්තාරය විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

## 14. ළමා ගීත ඒකල - ගැහැණු / පිරිමි - වයස් සීමාව - අවු: 12න් පහළ

**නිර්දේශිත ගීත :**

- පොළොවෙන් මතුවන මිණිකැට
- ඇය කොන්ඩෙ දිගට දාලා
- මිදුලේ වැලි මාලිගාවෙ

i. ඉහත ගීත අතුරින් ගායනා කළ හැක්කේ එක් ගීතයක් පමණි.
ii. පෙරවාදන, අතුරුවාදන ආදී ශිල්පාංග සමගින් මුල් නාද මාලාවට හානි නොවන පරිදි ගායනය ඉදිරිපත් කළ යුතුය.
iii. ඕනෑම වාද්‍ය භාණ්ඩයක් මේ සඳහා යොදා ගත හැක.
iv. සහය වාදනයට සහභාගී විය හැකි සංඛ්‍යාව, තරගකරු හැර උපරිමය 08 කි.
v. විදුලි ඕගනය භාවිත කරන්නේ නම්, පෙර සකස් කරන ලද සංගීත ඛණ්ඩ භාවිත කළ නොහැකි අතර, සියළු වාදන ඛණ්ඩයන් සජීවීව වාදනය කළ යුතුය.

## 15. නුර්ති ගී - ඒකල - ගැහැණු - වයස් සීමාව - අවු : 15-21

**නිර්දේශිත නුර්ති** • ශ්‍රී වික්‍රම
• රාමායනය

i. ඉහත නුර්තියකට අයත් එක් ගීතයක් ගායනා කළ යුතුය.
ii. සහය වාදනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 06 කි.
iii. විද්‍යුත් භාණ්ඩ භාවිත කළ නොහැකි අතර, සිතාර්, තබ්ලා, බටනලා, වයලීන්, බොක්ස් ගිටාර්, සර්පිනා, එස්රාජ්, මැන්ඩලීන්, දිල්රුබා, ආදී භාණ්ඩ යොදාගත හැකිය.

## 16. නාඩගම් ගී - ඒකල - පිරිමි - වයස් සීමාව - අවු : 15-21

**නිර්දේශිත නාඩගම්** • බැලසන්ත
• ජොහානා

i. ඉහත නාඩගමකට අයත් එක් ගීතයක් ගායනා කළ යුතුය.
ii. සහය වාදනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05 කි.
iii. විද්‍යුත් භාණ්ඩ භාවිත කළ නොහැක.

සැ.යු.

- **මේ සඳහා නාඩගම් සම්ප්‍රදායට අදාළ වාද්‍ය භාණ්ඩ පමණක් භාවිතා කළ යුතුය.**

**කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ**
**ලේකම්,**
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය,**
**බස්නාහිර පළාත.**